කොළඹ දිසා අධිකරණයේ දීය

හොටේල් ඩෙවලපර්ස් (ලංකා) ලිමිටඩ්,
කොළඹ හිල්ටන් ක්‍රීඩා සංකීර්ණය,
එචලන් චතුරශ්‍රය, ලෝටස් පාර,
කොළඹ 01.

පැමිණිලිකරු

නඩු අංකය : 15322/එම්.ආර්.

එදිරිව

නිහාල් ශ්‍රී අමරසේකර,
අංක 167/4, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ 10.

විත්තිකරු

මෙම නඩුවේ පැමිණිලිකරු සහ විත්තිකරු, මෙම නඩුවට ගොණු කරනු ලැබ ඇත්තාවූ සහ මෙයට 'X' යනුවෙන් ලකුණු කොට යාකරනු ලැබ ඇත්තාවූත්, 1995.06.28 දින දරණ සම්පූර්ණ ගිවිසුමකට ඇතුළත්ව ඇති හෙයින්ද

ඒ අනුව ක්‍රියා කරමින්, එම සම්ථය ගිවිසුම ප්‍රකාරව, මෙම කාරණය බේරුම්කිරීමකට යොමු කරවනු ලැබ ඇති බව ගෞරවණීය ඔබ තුමාණන්ගේ අධිකරණ වෙත දන්වා සිටින ලද හෙයින්ද

'X' යනුවෙන් ලකුණු කර ඇති ඉහතකී වෙනම වූ ගිවිසුම, කොළඹ දි.උ. අංක 5095/විශේෂ නඩුවේ හබයට නගනු ලැබ ඇති 1995-06-28 දිනැති දරණ අංක 1, 2, 3 සහ 4 දරණ ගිවිසුම්වල සඳහන්ව ඇති බැවින්, එකී කොළඹ දි.උ. අංක 5095/විශේෂ දරණ නඩුවේ අතුරු ඉන්ජන්ක්ෂන් තහනම සහ ඉන් අනතුරුව, අභියාචනාධිකරණයේ අංක 721/98 දරණ ප්‍රතිශෝධනය කිරීම සඳහා වන ඉල්ලීමෙහි කරනු ලැබ ඇති නියෝගයත්, වෙනම ගිවිසුමක් වන එය ක්‍රියාවෙහි යෙදවීමෙන් පැමිණිලිකරු වලක්වාලනු ලැබ ඇති බවද, වෙනත් දේ අතර, පවසමින්, පැමිණිලිකරු විසින් බේරුම්කරු ඉදිරියෙහි 2000.06.19 දින දරණ දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කරන ලද බැවින් ද

'X' යනුවෙන් ලකුණු කොට මෙයට අමුණනු ලැබ ඇති ඉහතකී වෙනම සම්පූර්ණ ගිවිසුමේ 1 වන වගන්තියේ දක්වනු ලැබ ඇති පරිදි පැමිණිලිකරු විසින් සියළුම බැඳියාවන් ඉටු කරනු ලැබ ඇතැයි ද, ඉහතකී දිවුරුම් ප්‍රකාශයේ අවසන් ඡේදයෙහි, පැමිණිලිකරු විසින්, වෙනත් දේ අතර, ප්‍රකාශ කොට සහතික කරනු ලැබ ඇති හෙයින් ද

'X' යනුවෙන් ලකුණු කොට මෙයට යාකරනු ලැබ ඇති ඉහතකී සමථය ගිවිසුමේ 1 ඡේදයේ දැක්වෙන්නේ පහත සඳහන් අයුරින් වන බැවින් ද :

> '' නිහාල් ශ්‍රී අමරසේකර මහතාට එරෙහිව පවරනු ලැබ ඇති කොළඹ දි.උ. අංක 15322/එම්.ආර්. දරණ නඩුවේ සමාගම නියෝජනය කරමින් එහි ලේඛණගත නීතිඥවරයා ලෙස ක්‍රියා කිරීමට, නීතිඥ හුසේන් අහමඩ් මහතාට ප්‍රදානය කර ඇති පෙරකලාසිය ප්‍රත්‍යාදිෂ්ට කිරීමත්, එම නඩුව ක්ෂණිකවම ඉල්ලා අස්කර ගැනීමත් ශොවේල් ඩෙවලපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගම විසින් කළ යුතුය සහ කරනු ලබන්නේය''

ඉහතකී අභියාචනාධිකරණයේ අංක 721/98 දරණ ප්‍රතිශෝධන ඉල්ලීමේ නියෝගයට එරෙහිව අභියාචනා කිරීමේ අවසරය, ශ්‍රේෂ්ඨාධිකරණ (විශේෂ) අභියාචනා කිරීමේ අවසරය පැමිණීමේ අංක 120/99 සහ 121/99 දරණ ඉල්ලීම්හි ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 1999.12.16 වන දින කරන ලද නියෝගය මගින්, ප්‍රදානය කරන ලද හෙයින් ද

සමථයක් ඇති කිරීම සඳහා ගරු නීතිපති තුමා මැදිහත් විය යුතුයයි, ඉහතකී අභියාචනය ශ්‍රේෂ්ඨාධිකරණය අභියස එළඹුන අවස්ථාවේ, ගෞරවණීය අග විනිසුරු උතුමානන් විසින් යෝජනා කරන ලදුව, එය ගෞරවණීය අග විනිසුරු උතුමාණන් අභියසදී 2001.06.18 වන දින තහවුරු කර සිටිනු ලැබීමෙන්, මෙය දැන් ශ්‍රේෂ්ඨාධිකරණයේදී 2001.10.19 වන දින සඳහන් කිරීමට නියමිතව ඇති බැවින් ද

ඉහතකී කාරණයන්ට ආනුෂන්ගිකව, විත්තිකරු සහ ඔහුගේ නීතිඥවරයා විසින් ගරු නීතිපති තුමා සමග සහ ගෞරවණීය අග විනිසුරු උතුමාණන් අභියස සාකච්ඡා පවත්වන ලද අතර, ඉහත සඳහන් පරිදි පැමිණිලිකරු පවසා ඇති අවියෙන්ම, මෙම නඩුවෙහි කාරණයද, ඉහතකී යෝජිත සමථයෙහි [illegible] සහ එයට බැඳෙන්නක් ලෙස ගනු ලබන බව, එම සාකච්ඡාවනහිදී සනාථ කරමින් එකඟව ඇති හෙයින් ද

තවද, 1995-03-15 වන දින පැමිණිලිකරුට බාර කරන ලද විමාරණවලට උත්තර නොදී පැවත, පැමිණිලිකරුගේ අනුමැතියකින් තොරව, පැමිණිලිකරුගේ එවකට සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ 1995-06-15 වන දින දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින්, පැමිණිලිකරු විචාරණවලට උත්තර දීමට බැඳී නොසිටින බව ප්‍රකාශ කර සිටිනු ලැබ ඇති බව ගෞරවණීය ඔබ තුමාණන්ගේ අධිකරණයේ අවධානයට යොමු කරවා සිටිනු ලබන හෙයින් ද

ඉන් අනතුරුව, 1995.06.28 වන දින, පැමිණිලිකරුගේ එකී සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂවරයා ඉවත් කරන ලද අතර, ඉහතකී අංක 1, 2, 3 සහ 4 දරණ අනිකුත් සමථය ගිවිසුම් අතර, මෙයට 'X' යනුවෙන් ලකුණු කොට අමුණා ඇති වෙනමවූ සමථය ගිවිසුමටද එළඹෙන ලද හෙයින් ද

විචාරණවලට උත්තර නොදීමේ කාරණය ගෞරවණීය ඔබ තුමාණන්ගේ අධිකරණය විසින් 1995.08.18 වන දින විමසීම සඳහා නියම කරන ලදුව, 1996.02.29 වන දින පාර්ශව කරුවන් විසින් ලිඛිත දේශන ඉදිරිපත් කරනු ලැබීමෙන්, ඒ සම්බන්ධයෙන් නියෝගයක් නොදී පවතින බැවින්ද

එසේ හෙයින්, ඉහත සඳහන් හේතූන් කරණකොට ගෙන, මෙම නඩුව 2001.07.31 දින විභාග රෝලෙන් ඉවත් නොකොට, ඉවෙනත් දේ අතර, මේ සම්බන්ධයෙන් ඉහතකී පරිද්දෙන්
වෙනත් දේ අතර, මෙම නඩුවට සම්බන්ධව
ගරු නීතිපති තුමා අභියස පවත්නා සමථය සාකච්ඡාවන්හි තත්වය වාර්තා කරනු පිණිස, 2001.10.19 දිනට පසු ගෞරවණීය ඔබ තුමාණනන්ගේ අධිකරණයට සුදුසු දිනයකට මෙම නඩුව ඇමතීමට නියම කරන මෙන් ගෞරව පූර්වකව ඉල්ලා සිටිමු.

මෙම මෝසම 2001.07.31 වන දින සභාව කොට තහවරු කර සිටීමට පෙත්සම්කරුගේ නීතිඥවරයාට අවසරය දෙන මෙන්ද වැඩිදුරටත් ගෞරව පූර්වකව ඉල්ලා සිටිමු.

2001 ජූලි මස 20 වන දින කොළඹ දීය

D Silva

විත්තිකරුගේ නීතිඥ

මෙම මෝසමේ පිටපතක් පැමිණිලිකරුගේ ලේඛණගත නීතිඥ මහතා වෙත ලියාපදිංචි තැපෙලෙන් යවන ලදුව, ලියාපදිංචි තැපැල් භාණ්ඩ කුවිතාන්සිය මෙයට අමුණා ඇත

D Silva

විත්තිකරුගේ නීතිඥ

---

තැ. කා. රෙ. O. I. } 2

(44 G. S. M. 24 Orig. buff Dup. blank white S. T. & E.) 03/96

අංකය இல. No. 19587

ලියාපදිංචි තැපැල් භාණ්ඩ කුවිතාන්සිය
பதிவு அஞ்சற் பொருள் பற்றுச்சீட்டு
REGISTERED POSTAL ARTICLE RECEIPT

යවන්නාගේ නම හා ලිපිනය / அனுப்புபவரின் பெயரும் முகவரியும் / Name & Address of Sender } Mr./Miss/Mrs. de Silva & Perera මයා./මිය./මෙනවිය திரு./திருமதி/செல்வி

ලබන්නාගේ නම හා ලිපිනය / முகவரியாளரின் பெயரும் முகவரியும் / Name & Address of Addressee } Mr./Miss/Mrs. Mr Mahinda Wickramarathne මයා./මිය./මෙනවිය திரு./திருமதி/செல்வி Attorney at Law & Notary Public Lawyers office complex 34/33 ... Colombo 12

රක්ෂණය කළ මුදල / காப்புறுதி செய்யப்பட்ட தொகை / Insured for } රු./ரூ./Rs. ........ ශ./ச./C. ........ ඒ සඳහා මෙහි දක්වා ඇති ගාස්තුව ගෙවා ඇත. இது விடயமாக இங்கே குறிப்பிடப்பட்டுள்ள கட்டணம் செலுத்தப்பட்டுள்ளது. For which the following fees have been paid.

රක්ෂණ ගාස්තුව / காப்புறுதிக் கட்டணம் / Insurance Fee } ........

ලියාපදිංචි ගාස්තුව / பதிவுக் கட்டணம் / Registration Fee } 13/50

දින මුද්‍රාව

භාරගත් නිලධාරියාගේ අත්සන / பெற்றுக்கொள்ளும் அலுவலரின் கையொப்பம் / Receiving Officer's Signature.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

TRUE COPY
DE SILVA & PERERA
Attorneys-at-law & Notaries Public
34/34, 65 & 1/45, New Lawyers
SAN SEBASTIAN HILL
COLOMBO - 12.

X

**SETTLEMENT AGREEMENT**

**D.C. COLOMBO ACTION NO. 15322/MR**

WHEREAS Settlement Agreements have been entered into for the settlement and withdrawal of D.C. Colombo Actions Numbered 3155/Spl., and 3231/Spl., by and between the relevant Parties thereto

AND WHEREAS as per Clause 3 (ii) (i) of the Settlement Agreement No. 4, D.C. Colombo Action No. 15322/MR, filed by Hotel Developers (Lanka) Ltd., against Nihal Sri Ameresekere shall and will have to be withdrawn and settled

THEREFORE it is agreed by and between HOTEL DEVELOPERS (LANKA) LTD., and NIHAL SRINATH AMERESEKERE as follows;

1. Hotel Developers (Lanka) Ltd., shall and will;

   i. revoke the proxy given to Mr. Hussain Ahamed, Attorney-at-Law, to act as the Registered Attorney representing the Company in D.C. Colombo Action No. 15322/MR instituted against Mr. Nihal Sri Ameresekere and have the said Action promptly withdrawn.

   ii. tender a Letter of explanation and apology to Mr. Ameresekere for the aforesaid baseless and mala-fide Action instituted against him.

   iii. tender a Letter of explanation and apology to Mr. Ameresekere for having caused baseless and malicious complaints to have been made to the Institute of Chartered Accountants of Sri Lanka and the Institute of Chartered Management Accountants of U.K., by Mr. John Wilson, Attorney-at-Law, acting for and on behalf of Hotel Developers (Lanka) Ltd.

   iv. forward Letters of explanation to the Institute of Chartered Accountants of Sri Lanka and the Institute of Chartered Management Accountants of U.K., regarding the aforesaid complaints, with copies to Mr. John Wilson, the said Attorney-at-Law.

   v. forward Letters of explanation to the persons to whom the Chairman & Managing Director of Hotel Developers (Lanka) Ltd., had forwarded Letters maliciously defaming Mr. Ameresekere.

   vi. consider the Claim in Reconvention made by Mr. Ameresekere in the said D.C. Colombo Action No. 15322/MR and further damages that accrue to him, arising from the said baseless and malicious complaints made to the aforesaid professional institutions of which Mr. Ameresekere is a Fellow Member and also arising from the said Letters that have been forwarded by the Chairman & Managing Director of Hotel Developers (Lanka) Ltd., to Her Excellency the President, Hon. Ministers and other Officials.

   vii. consider taking appropriate action against Mr. Cornel L. Perera, Chairman & Managing Director of Hotel Developers (Lanka) Ltd. and any other Director/s, who was/were responsible for the aforesaid baseless and malicious actions against Mr. Ameresekere.

2. Upon the due performance, observance and fulfilment of the aforesaid terms and conditions, in consideration thereof, Mr. Nihal Sri Ameresekere shall and will not proceed against Hotel Developers (Lanka) Ltd., in relation to any of the aforementioned matters.

3. Mr. Nihal Sri Ameresekere, however, reserves the right to proceed against any of the Directors of Hotel Developers (Lanka) Ltd., and/or any Companies that they represent/represented and/or the Secretaries and/or the Counsel of Hotel Developers (Lanka) Ltd., and/or any other connected person/s in connection with any of the aforementioned matters.

This 28th day of June 1995.

........................
DIRECTOR
HOTEL DEVELOPERS (LANKA) LTD

..........................
NIHAL SRINATH AMERESEKERE

WITNESSES

1. Lilawati Ameresekere.

2.

........................
DIRECTOR
HOTEL DEVELOPERS (LANKA) LTD

WITNESSES

1.

2..